# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 33 දරන ක්‍රීඩා
## (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2005** සැප්තැම්බර් මස **23** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. **4.25** යි.  තැපැල් ගාස්තුව **:** රු. **5.00** යි.

**2005 අංක 33 දරන ක්‍රීඩා (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2005 සැප්තැම්බර් මස 23 වන දින]

එල්. ඩී.–ඕ. 10/2005.

**ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2005 අංක 33 දරන ක්‍රීඩා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1973 අංක 25 දරන පනතේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන පනතේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ ද, නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන්නා වූ ද ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවේ සාමාජිකයන් සිටී නම් එම සාමාජිකයන් .".

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

18අ. නිලබලයෙන් පත්වන සාමාජිකයන් හැර එම කමිටුවේ සෑම සාමාජිකයකුම අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය." .

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.